050

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2008

**ESC 2222 - ළමා අයිතිවාසිකම්**

කාලය - පැය තුනයි.

---

දිනය - 2008 අගෝස්තු 29 වන දින  වේලාව - ප.ව.01.30- ප.ව.04.30

---

ප්‍රශ්න හතරකට <u>(04) පමණක්</u> පිළිතුරු සපයන්න.

01. i. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ ඇතුළත් කර ඇති ළමා අයිතිවාසිකම් කාණ්ඩ මොනවා ද?

(ලකුණු 05)

ii. මෙම අයිතිවාසිකම් කාණ්ඩ එකිනෙකට සම්බන්ධ වන්නේ මන්දැයි උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. ඔහු හෝ ඇයගේ පුද්ගල අනන්‍යතාව සඳහා ළමයෙකුට ඇති අයිතිය ආරක්ෂා කිරීමට අවශ්‍ය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. i. ශ්‍රී ලංකාවේ ළමයින්ගේ අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ගෙන ඇති වැදගත් පියවර පහක් විස්තර කරන්න.

(ලකුණු 09)

ii. නිදහස ලැබීමෙන් පසු යුගයේ ළමයින්ගේ අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් අවශ්‍ය පියවර ගැනීමට මුල් වූ සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 16)

03. i. "ළමා අපයෙදුම" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 10)

ii. ළමා අපයෙදුම් වර්ග තුනක් නම් කර එම එක් එක් වර්ගය විස්තර කරන්න.

(ලකුණු 15)

04. "සාමාන්‍ය ළමයින් සමග සසඳන කළ 'විශේෂ ළමයින්' ලෙස හඳුන්වනු ලබන ළමයිනට තවමත් අධ්‍යාපනයට ප්‍රවේශ වීමට නොහැකිය."

i. ඔබ මෙම කියමන සමග එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 09)

ii. එබඳු ළමයිනට ඔවුන්ගේ
(අ) නිවස හා
(ආ) අධ්‍යාපන ආයතන
තුළදී අධ්‍යාපන අවස්ථා සැපයීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කරන්න.

(ලකුණු 16)

05. i. බාලවියේ ළමයින්ගේ අධ්‍යාපනය හා කායික සංවර්ධනය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ළමයින්ගේ කායික සංවර්ධනයට බාධාකාරී වන සාධක විස්තර කරන්න.

(ලකුණු 15)

06. පහත දැක්වෙන ඕනෑම තුනක් (03) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) සහභාගිත්ව අයිතිය
(ආ) ළමා අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීම සඳහා ගත යුතු පියවර
(ඇ) අවතැන් වූ ළමයින්
(ඈ) අනිවාර්ය අධ්‍යාපන පනත

(ලකුණු 8 x 3 + 1 = 25)

- හිමිකම් ඇවිරිණි. -